**<u>කොළඹ, මල්පාර දේශපාලන කාර්යාලයේ අද (17) පැවැති ජනතාවාදී ඒකාබද්ධ විපක්ෂයේ මාධ්‍ය සාකච්ඡාවේදී මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පළ කල අදහස්</u>**

මෙවර අයවැය ලේඛනය මගින් ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් කෝටි ප්‍රකෝටි ගණනින් මුදල් වෙන් කර ඇති බව රජය විසින් පැවසුවද, පවතින නීතිමය හා පරිපාලනමය බාධා හේතුවෙන් එම මුදල් බිම් මට්ටමේ ක්‍රියාත්මක කර ජනතාවට සහන සැලසීමට කිසිම ප්‍රායෝගික වැඩපිළිවෙලක් දක්නට නැහැ.

රජයේ මාණ්ඩලික නිලධාරීන් ටෙන්ඩර් පටිපාටිය හරහා මුදල් වියදම් කිරීමට දැඩි බියක් දක්වනවා. පසුකාලීනව සිදුවන විමර්ශන සහ 'ත්‍රස්තවාදයට විරුද්ධව රාජ්‍යය ආරක්ෂා කර ගැනීමේ පනත' වැනි නව නීති හේතුවෙන් සද්භාවයෙන් හීන්දු ගන්නා නිලධාරීන් පවා අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබීමේ අවදානමකට ලක්ව තිබේ. මේ නිසා වගකීම් භාර ගැනීමෙන් නිලධාරීන් වැළකී සිටීම හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම ඇණහිට තිබෙනවා.

"දින්වා" ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් රුපියල් බිලියන 500ක් වෙන් කළද, ඉන් වැය කර ඇත්තේ 8% ක් වැනි ඉතාම සුළු අගයක් පමණි. ගිය වසරේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ රුපියල් බිලියන 1,380න් වසර මැද වන විට වැය කර තිබුණේ 18% ක් පමණක් වන අතර, වසර අවසානයේදී පවා වැය කළ හැකි උපරිමය 30% - 40% අතර අගයකි. මෙවර අයවැයෙන් රුපියල් බිලියන 2,000ක් වෙන් කළද, පෙර වසරේ වියදම් කළ ආකාරය පිළිබඳ කිසිදු වාර්තාවක් රජය ඉදිරිපත් කර නොමැත.

වත්මන් රජය බලයට පත් වන විට බිංදුව මට්ටමේ (0.8%) පැවති උද්ධමනය මේ වන විට 8.3% දක්වා වර්ධනය වී තිබේ. එමෙන්ම රනිල් වික්‍රමසිංහ මහතාගේ පාලන සමයේ රුපියල් 293 දක්වා අඩු කරගත් ඩොලරයේ අගය, මේ වන විට රුපියල් 337 දක්වා ඉහළ ගොස් ඇත.

මැදපෙරදිග යුද්ධය නිසා ඩොලරය ඉහළ ගිය බවට රජය කරන ප්‍රකාශ සම්පූර්ණයෙනම් පදනම් විරහිතයි. 2026 පෙබරවාරි 28 වැනි දින යුද්ධය ආරම්භ වීමටත් පෙර ඩොලරය රුපියල් 325 දක්වා ඉහළ ගොස් තිබිණි.

පසුගිය වසරේ දෙවැනි කාර්තුව සහ මේ වසරේ දෙවැනි කාර්තුව සමඟ සසඳන විට, මෙරට ආර්ථික සංවර්ධනය 5.1% සිට 4.2% දක්වා සැලකිය යුතු ලෙස සංකෝචනය වී තිබේ. විදේශීය ආයෝජන රට තුළ රඳවා ගැනීමට අවශ්‍ය ස්ථාවර සහ හිතකර පරිසරයක් අහිමි වීම මේ ආර්ථික පසුබෑමට ප්‍රධානම හේතුව වී ඇත.

හිටපු රජය විසින් සම්මත කරගත් 'ආර්ථික පරිවර්තන පනත' වත්මන් රජය විසින් අත්හිටුවීම නිසා විදේශ සංචිත වර්ධනය නතර වී ඇත. රනිල් වික්‍රමසිංහ පාලනයේ මාස 28 තුළ ඩොලර් මිලියන 6,000කින් සංචිත වර්ධනය වුවද, වත්මන් රජයේ මාස 28 තුළ එය වර්ධනය වී ඇත්තේ ඩොලර් මිලියන 1,000කින් පමණි.

මේ හේතුවෙන් නව ආයෝජන නොලැබෙනවා පමණක් නොව, පවතින ආයෝජනද රට හැර යමින් පවතී:

විශේෂයෙන්ම අදානි සමාගමේ ඩොලර් මිලියන 500ක බලශක්ති ආයෝජනය රටට අහිමි විය. චයිනා මර්චන්ට් සමාගම විසින් චීන වරායේ ක්‍රියාත්මක කරන්නට තිබූ ඩොලර් මිලියන 392ක ව්‍යාපෘතිය නතර විය. දීර්ඝ කාලයක් මෙරට ක්‍රියාත්මක වූ ඇඟලුම් ක්ෂේත්‍රයේ සමාගමක් වන නෙක්සස් (Nexus) සමාගම රට හැර යාමට තීරණය කිරීම නිසා රැකියා 2,000ක් අහිමි වීමේ අවදානමක් මතුව තිබේ.

මීට අමතරව විදේශ ආයෝජන සඳහා සුදුසු වාතාවරණයක් රට තුළ නොමැති වීම නිසා, බංගලාදේශය සහ වියට්නාමය වැනි වෙනත් රටවල් කරා ආයෝජන ඇදී යමින් පවතිනවා. ගෝලීය මට්ටමේ දැවැන්ත සමාගම් සහ බ්‍රෑන්ඩ්ස් (Brands) මෙරට අත්හැර යාම හරහා ආර්ථිකය තවදුරටත් අවදානමකට ලක්ව තිබේ.

ලෝක බැංකු වාර්තා අනුව මෙරට ජනගහනයෙන් 30%ක් දරිද්‍රතාවයෙන් පෙළෙන අතර මිලියන 6කට දිනකට එක පෝෂ්‍යදායී ආහාර වේලක් හෝ ලබා ගැනීමට නොහැකි වී ඇත. රජය ලබා දුන් පොරොන්දු ඉටු නොකිරීම නිසා වෛද්‍ය, ඉංජිනේරු, ගුරු, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු සියලුම වෘත්තීය සමිති අද වන විට විශ්වාසභංගත්වයට පත්ව වීදි බැස ඇත.

මේ හේතුවෙන් සමස්ත වෘත්තීය සමිති ක්ෂේත්‍රයම අද වන විට රජයට එරෙහිව අතෘප්තියෙන් පසුවේ. තමන් දැරූ බලාපොරොත්තු සහ දුන් පොරොන්දු ඉටු නොවූ තැන, මේ සියලු පාර්ශ්වයන් රජයේ ක්‍රියාමාර්ගවලට එරෙහිව නැවත වරක් සටන් බිමට පිවිසීමේ සූදානමක පවතිනවා.

2027 වසරේදී විදේශ ණය ගෙවීම ආරම්භ කිරීමට නම් ආර්ථික වර්ධනය අත්‍යවශ්‍යයි. ඒ සඳහා ණය ලබාගැනීමට නම් විදේශ ආයෝජන රටට ලැබිය යුතුයි. නමුත් අවාසනාවකට කිසිදු විශාල විදේශ ආයෝජනයක් ලංකාවට ලබාගැනීමට වත්මන් රජය අපොහොසත් වීම රට බරපතල ඛේදවාචකයකට මුහුණදීමක් බව මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

## මේ මාධ්‍ය සාකච්ඡාවේදි අදහස් දැක්වූ එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන මහතා

අපි කල්පනා කරලා බැලුවොත් අද මේ ඉන්න මාධ්‍යවේදීන් දොළොස් දෙනා, එහෙම නැත්නම් මේ ඉන්න කණ්ඩායම, කල්පනා කරන්නේ අද දවල් වේල කොහොමද සපයාගන්නෙ කියන එකයි. සැඟවුණු යථාර්ථය එයයි. එහෙම නැතිනම් ගෙදර හෝ ඉස්කෝලේ යන ළමයාගේ වැඩ කටයුතු කොහොමද කරන්නේ කියන එක තමයි ප්‍රධානම අභියෝගය වී තිබෙන්නේ. මේ තමයි සමාජයේ තිබෙන යථාර්ථය.

මේ සමාජ යථාර්ථයට පිටින් ක්‍රියා කරන්න බැහැ. උදාහරණයක් හැටියට ආණ්ඩුවක් බාර ගන්නකොට ඉලක්කයක් තිබිය යුතුයි. 1970-1977 කාල සීමාව තුළ ඇති වූ දේශීය ආර්ථික අර්බුදය විසඳා ගැනීම සඳහා 1977 එක්සත් ජාතික පක්ෂය එහෙම නැත්නම් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා ප්‍රමුඛ රජය බාර ගන්නකොට ඒ

රජයට ඉලක්කයක් තිබුණා. ඒ නිසා තමයි ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා රට බාරගෙන ඇමරිකාවට යන්නේ. එංගලන්තයට යන්නේ. ඒ ගිහින් එතුමා හිස් අතින් එන්නේ නැහැ. එංගලන්තයට ගිහිල්ලා වික්ටෝරියා වේල්ල ඉදිකරන්න අවශ්‍ය ශක්තිය අරගෙන එනවා. මේ රටේ ඒ අවස්ථාවේදී විදුලිය තිබුණේ මෙගාවොට් 400 යි. නැවත රට බාර දෙන්නෙ මෙගාවෝට් 4000 ගානක් කරලා. පසුව එතුමා ජර්මනියට යනවා, රන්දෙනිගල අරගෙන එනවා. ජපානයට ගිහින් අද ඔය පාර්ලිමේන්තුවේ වාඩි වෙලා ඉන්න 225 දෙනාට වාඩි වෙන්න පාර්ලිමේන්තුවක් හදලා දෙනවා. ඊට පස්සේ මහජනයාට අසනීප වුණොත් යන්න ඇඳන් 1000 ක රෝහලක් හදලා දෙනවා. එක ඇඳක් වැඩිපුර දෙනවා ජපානයේ අග්‍රමාත්‍යවරයා ජනාධිපතිවරයාට.

කොළඹ නගරය ජයවර්ධනපුර නගරය බවට පත් කරනවා. ලංකාවේ නගර දහස් ගණනක් ඇති කරනවා. ඩොලර් විශාල ප්‍රමාණයක් රටට ගලාගෙන එනවා. වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ, මාදුරුඔය, ඉගිනිමිටිය මහා ඇළවේලි සේරම ඉදි කරලා, කුඹුරු අක්කර ලක්ෂ 20ක් විතර නගුලට යට කරලා, ආර්ථිකයේ විශාල පරිවර්තනයක් ඇති කරනවා. ඉතිහාසයේ සෑම පාලකයෙක්ම, ඩී. එස්. සේනානායක මැතිතුමාගෙන් පටන් ගත්තාම සියලුම පාලකයින් එහෙම තමයි ගමන් කරලා තිබෙන්නේ. මෙන්න මේ විදිහට ඉලක්කයක් ඇතුවයි රාජ්‍යයක් බාරගත යුත්තේ.

මේකෙ වැරැද්ද තිබෙන්නේ පාලකයාගේ නොවෙයි, ඡන්දදායකයාගේයි. ඇයි අපි කියනවා ඡන්දදායකයා අහන්නෙ නැහැ, වෛරයෙන් ඒ දෙස බලනවා. අද බැලුවොත් වැඩිපුරම ආණ්ඩුවේ නියෝජනය කරන කණ්ඩායම් තමයි අසභ්‍ය වචන පාවිච්චි කරන්නෙ. ෆේස්බුක් එකට ගියාම බලන්න පුළුවන්, මොන තරම් තමන්ගේ පාසල් යන දරුවාට බලන්න බැරි වචන පාවිච්චි කරනවද?, ඒ වර්තමාන පාලන යන්ත්‍රය නියෝජනය කරන සාමාජික සාමාජිකාවෝ. ඉතින් කොහොමද රටක් ඉතුරු වෙන්නේ? මේක තමයි යථාර්ථය.

ඇත්තවශයෙන්ම අය වැයක් ගැන කතා කරන්න දෙයක් නැහැ. මම හිතන්නේ ඒක ගැන කතා කරනවානම් අපරාදෙ නිකන් වෙලාව නාස්ති කිරීමක් පමණයි. මහාචාර්ය පීරිස් මැතිතුමා කිව්වා වගේ, නිලධාරීන් කවුරුත් වැඩ කරන්නේ නැහැ. මම 2001 වර්ෂයේදී ලංකාවේ රාජ්‍ය පරිපාලන ඇමති. මට අවස්ථාව ලැබුණා රාජ්‍ය නිලධාරීන් සමඟ වැඩ කරන්න. ඔබ අහලා ඇති කෙනෙක් ඩිස්මිස් වුනොත් නැවත රස්සාව ගන්න බැහැනේ. ඒකනේ ඔබ දන්න මතය. ඒකනේ සමාජය දන්න මතය.

නමුත් මට අවස්ථාව ලැබුණා 2001 විෂයබාර ඇමතිවරයා හැටියට ඩිස්මිස් වුණු අයට නැවත පෙන්ෂන් එක අරන් දෙන්න. අද පෙන්ෂන් ගිය අය, පෙන්ෂන් ගිය ලේකම්වරු ආපහු ගෙනැවිත් හිරේට දානවා. රාජ්‍ය සේවකයෝ කවුරුවත් ඒ තත්ත්වය යටතේ වැඩ කරන්නේ නැහැ. මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා කිව්වා, සද්භාවයෙන් කරන ක්‍රියාවක් කොහොමද ආරක්ෂා කරන්නේ? යම් ඉංජිනේරුවෙක් සද්භාවයෙන් පාලමක් හැදුවාම, මොනයම් හෝ කාරණාවක් නිසා ඒ පාලම කඩා වැටෙන්න පුළුවන්. ස්වභාවික විපතක් හෝ වෙනත් ක්‍රියාවක් වෙන්න පුලුවන්. ඒ එතුමා හිතාමතා කරන කාරණයක් නොවෙයි. නමුත් මේ රජය කොහොමද සද්භාවයෙන් ක්‍රියා කරන රාජ්‍ය නිලධාරීන් ආරක්ෂා කර ගන්නේ?

එහෙම රටක රාජ්‍ය නිලධාරීන් කවුරුවත් වැඩ කරන්නේ නැහැ. ඒ නිසා තමයි මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා කිව්වා වගේ 20% යි සමහර අමාත්‍යාංශ වල ප්‍රගතිය. කවුරුවත් වගකීම බාර ගන්නේ නැහැ.

නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියලා තිබෙන්නේ වෙනස් කතාවක්. ප්‍රශ්නය තියෙන්නේ ඒ කියලා තියෙන එක ක්‍රියාත්මක නොවීමයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියලා තිබෙන්නේ,

52 (1) - "අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ සෑම අමාත්‍යාංශයක් සඳහාම ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙකු වන්නේය. "

(2.) – "අමාත්‍යාංශයක ලේකම්වරයා ඔහුගේ අමාත්‍යාංශය බාරව ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද වෙනත් ආයතන ද අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව මෙහෙය වන්නේය. "

අමාත්‍යවරු දෙන නියෝග ආපහු වෙනත් ආයතනයකින් ඒකට වෙනත් කරුණු කාරණා එකතු කරනවා නම් කිසිම අමාත්‍යාංශ ලේකම්වරයෙක් එතනින් පහළ ඉන්න කිසිම රාජ්‍ය සේවකයෙක් ඒ මුදල් පරිහරණය කිරීමේ වගකීම බාර ගන්නේ නැහැ. ඒක තමයි අද රටට වෙලා තිබෙන තත්ත්වය.

අපි පිළිගන්නවා අපි ගෙනාව උදාහරණයක් හැටියට මමත් අත ඉස්සුවා ඒ වෙලාවේ මෙතන ඉන්න අපේ ඇමතිතුමත් අත ඉස්සුවා මේ අංක 09 දරන දූෂණ විරෝධී පනත. මෙහෙම පනතක් ආසියාවේ කොහෙවත් නැහැ. ඇයි මේක ගේන්න වුණේ? හොරා හොරා හොරා කියන නිසා ඔන්න හොරාට හරියන එකක් ගෙනත් දුන්නා. දැන් මේකෙ තියෙනවා වගන්තියක්, යම්කිසි කෙනෙක් බොරු පෙත්සමක් ගැහුවොත් අසාධාරණයට ලක්වන පුද්ගලයාට අධිකරණයට ගොස් ක්‍රියා කරන්න පුළුවන්. ඒ වගේම මේකෙම තිබෙනවා වගන්තියක්, නිර්නාමික පෙත්සම් කරුවකු එවන එකකටත් එසේ ක්‍රියා කළ හැකිය. එතකොට නිර්නාමික කෙනාට විරුද්ධව කොහොමද අර අසාධාරණය සිද්ධ වෙන පුද්ගලයා අධිකරණයට යන්නේ?.

ඒ නිසා මේවා නැවත කල්පනා කරලා රට වෙනුවෙන් වෙනස් කරගත යුතු කාරණා කියන එක මතක් කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම මෙහෙම පනතක් ආසියාවේ කොහෙවත් නැහැ. ලෝකයේ නොදියුණු, ලෝකයේ නීති රීති නැති ඇතැම් රටවල් කිහිපයක පමණයි මේ වර්ගයේ පනත් තිබෙන්නේ. මම කියනවා ලංකාවේ සියලු දෙනාට ආපහු කියව ගන්න කියලා ඉන්දියාවේ දූෂණ විරෝධී පනත. ඉතින් ඒ නිසා ඉතා කල්පනාවෙන් ක්‍රියාකරන්න තිබෙනවා.

මේ පනත ගෙනාවේ රට අනාගතයේ බංකොළොත් නොවෙන්න. ඇයි මෙහෙම එකක් ගෙනාවේ? මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තියෙනවා 148, 149, 150, 151, 152. ඔබ අපිව පාර්ලිමේන්තුවට යවන්නේ මොනවා කරන්නද? මූල්‍ය පාලනයට. මහජන නියෝජිතයෝ නොකරන්නේ මොකක්ද? මූල්‍ය පාලනයම තමයි.

එතකොට මහජනයා තෝරන්නේ කවුද? දුප්පතාගේ හිතවතා දුප්පතා. එතකොට දුප්පතාගේ හිතවතා දුප්පතා නම් ඡන්දදායකයෝ තරහා වෙන්න එපා කිව්වට අභිගුණ්ඨකයෝ බවට පරිවර්තනය වෙනවා.

මේ සංකල්ප ගේන්න අපිත් සමහර කාලවල ක්‍රියා කර තිබෙනවා. දුප්පතාගේ හිතවතා දුප්පතා නොවෙයි. දුප්පතාගේ හිතවතා උගතා, බුද්ධිමතා, පෝසතා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, 151, 152 වගන්තිවල මොකක්ද කියලා තියෙන්නේ? මහජන නියෝජිතයන්ගේ ප්‍රධාන වගකීම මූල්‍ය පාලනය. එය හැර මහජන නියෝජිතයන් සියලු දේ කරනු ඇත. ඉතින් රටක් කවදාවත් ගොඩ යන්නේ නැහැ, ඒ නිසා තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වුණාම ඒ පත් වෙලා ඉන්න මහජන නියෝජිතයන්ට උගත්කම දැනුම ලබා දීපු නිසා මෙන්න මේ පනත ගෙනාවා. මේකට කියනවා පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාල පනත. මේක ගෙනල්ලා එතුමා කියනවා, පාර්ලිමේන්තුවට ගන්න අවුරුදු 30ක පළපුරුද්ද තිබෙන මුදල් අධ්‍යක්ෂක ජනරාල්වරයෙක්. වෙනම කාර්යාලයක් පිහිටුවන්න, මහජන බජට් ඔෆිස් එක පිහිටුවන්න, මහජන නියෝජිතයන්ට එතනින් දැනුම ලබා ගැනීමේ හැකියාව ඇති කරන්න.

අද මේවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ, එකක් ඔබ මතක තබා ගත යුතුයි. මහජනයා සහ සමස්ත රට, බොහොම අමාරුවෙන් ඉන්නේ. දැන් මෙතන ඉන්න අය මාස හයක් ඉස්සරහට ණය වෙනවා. මෙතන ඉන්න සමහර අය අවුරුද්දක් ඉස්සරහට ණය වෙනවා. සමහර අය තමන්ගේ කනකර පවා උකස් තියලා බේරගන්න බැරිව ඉන්නවා. ඒවා සින්නවෙනවා.

මේ 2026 කියන්නේ ඓතිහාසික වසරක්. ට්‍රිලියන ගණනක රත්රන් බඩු උකස් ආයතනවලින් අරගෙන තිබෙනවා. මෝටර් සයිකල් හිමිකරුවෝ ඉන්නවා ලක්ෂ 50ක්. පුළුවන් නම් මෝටර් සයිකලේ පොත තියලා කීයක් හරි ඉල්ලගෙන තිබෙනවා. ත්‍රීවීල් තියෙනවා මිලියන 1.7 ක් පමණ. ඒ අයත් එහෙමයි. විශාල කඩාවැටීමක් රටේ ඇතිවෙලා. මේක මහජනයා භුක්ති විඳියි. අපිට කියන්න තිබෙන්නේ අවසානයේ අද අපිට බැන්නත් කමක් නැහැ, හෙට අපි ගැන නැවත මතක් කරගන්න කියන එකයි.

තව පනතක් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ගෙනාවා. අනාගතයේ ලෝකෙට ශ්‍රී ලංකාව බාල්දු නොවෙන්න රාජ්‍ය ණය කෙසේද ගෙවන්නේ කියලා අනුපිළිවෙලක්. ගෙවන ඒවා බෝඩ් එකේ දාන්න ඕනේ. මහජනයා දැනගන්න ඕනේ. ගෙව්වා නම් මෙච්චර ගෙව්වා කියලා කියන්න ඕනෑ, කතා කරලා තේරුමක් නැහැ. මහජනයාට මේවා අපි ඉදිරිපත් කළාම මහජනයා අපිට ගෙදර යන්න කිව්වා. මමත් ඡන්ද 12කට ඉල්ලපු කෙනෙක්. අවසානයේදී ඡන්දය ඉල්ලුවේ නැත්තේ මට තේරුනා මේ ආණ්ඩුව කඩාගෙන වැටෙනවා කියලා. ඉතින් අපි එහෙම කිව්වම අපිට බනිනවා, අපිට පිස්සු කියනවා. හොඳටම පිස්සු හැදිලා කියනවා ෆේස්බුක් එකේ කමෙන්ට් දානවා. බලමු අනාගතයේදී අපිටද පිස්සු? කාටද පිස්සු කියලා.

දැන් අද දවසේ ගත්තහම තෙල් බැරලය ඩොලර් 92.44 යි. ඒ කාලේ රනිල් වික්‍රමසිංහ මහත්තයා මිල සූත්‍රය ගෙනාවම ඇහුවා ලෝකයේ තෙල් මිල වැඩිවෙනකොට මෙහේ තෙල් මිල වැඩි වෙන්න නම් ආණ්ඩුවක් මොකටද? පාලකයෝ මොකටද කියලා.

ඒ විතරක් නොවෙයි, මේ මොහොත දක්වා IMF එකේ හත්වැනි වාරිකය නිදහස් කිරීමට විධායක අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබිලා නැහැ. ලැබුණත් හොඳයි, නොලැබුණත් හොඳයි, ලැබුණත් වැටෙනවා, නොලැබුණත් වැටෙනවා. ඉතින් ඒ නිසා කල්පනාවෙන් ශ්‍රී ලංකා මහජනයා කටයුතු කළ යුතු තිබෙනවා.

ඇත්ත වශයෙන්ම රට ඉතාම භයානක තැනකටයි ගමන් කරමින් තිබෙන්නේ. සමස්ත ශ්‍රී ලාංකික මහජනයා බරපතල ඛේදවාචකයකයකයි ඉන්නේ. පාසල් ළමුන් ලක්ෂ 45ක්. ඒ අයගේ ශරීරයට සිදුවන හානිය, ඒ අයට මානසික වශයෙන් ඇතිවෙන පීඩනය සහ ශාරීරික සෞඛ්‍ය නැතිවීම ජීවිත කාලයට බලපාන කාරණාවක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා.

එවැනි යුග ආවහම තමයි සමහර අවස්ථාවල අපේ පාලකයෝ පාසල් ළමුන් ලක්ෂ 45 ටම බනිස් දී තියෙන්නේ. ජේ. ඒ. ජයවර්ධන මහත්තයා ආවහම පාසල් ළමුන් ලක්ෂ 45ටම පොත් දෙන්න පටන් ගත්තේ. ඇයි කිරි වීදුරුවක් දෙන්න පටන් ගත්තේ? ඒ ළමයින්ගේ පෝෂණය වැදගත් නිසායි. අද ලබා ගත යුතු පෝෂණය හෙට ලබා ගන්න බැහැ. හෙට ලබා ගත යුතු පෝෂණය අනිද්දා ලබා ගන්න බැහැ. මුළුමහත් ජාතියක් විනාශ කරන තැනට ගමන් කර තිබෙනවා.

ඒ ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඇත්ත වශයෙන්ම අයවැය ගැන මහාචාර්ය පීරිස් මැතිතුමා කිව්වා වගේ එතුමා ඉතාම වෘත්තිමය වශයෙන් පැහැදිලි කළා කරුණු කාරණා. ඉතාම නරක තැනකයි රට තිබෙන්නේ. ඉතින් මහජනයාට අපි කියනවා කල්පනාවෙන් සහ බුද්ධිමත්ව ක්‍රියා කරන්න කියලා.

## මේ මාධ්‍ය සාකච්ඡාවේදි අදහස් දැක්වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ උප සභාපති සුරේන් රාඝවන් මහතා

ශ්‍රී ලංකානු සමාජය, ශ්‍රී ලංකානු රාජ්‍යය, ශ්‍රී ලංකාව යන මේ අපේ මව්බිම එක්තරා විදිහක තුනමන් සන්ධියක අවදානමකට ලක්ව තිබෙනවා.

ඉතා පැහැදිලිව, ආර්ථික, පරිපාලනමය, සමාජමය, සංස්කෘතිකමය සහ අධ්‍යාත්මික යන මේ සියලු ක්ෂේත්‍රවල තමන්ට පාලනය කරගන්නට බැරි ආණ්ඩුවක් යටතේ වේගයෙන් සහ ස්ථිරව කඩා වැටීමක් අපට පෙන්නුම් කරනවා. ඒ නිසා ලබන අවුරුද්දේ අප මේ මොහොත වනවිට එනම් 2027 වසර අවසානයේ, අපේ රට කොතැන සිටියිදෝ කියා ආර්ථික විද්‍යාඥයන්ටවත්, සමාජ විද්‍යාඥයන්ටවත්, දේශපාලන විද්‍යාඥයන්ටවත් කියාගන්න බැරි තරමේ අවදානමක සිටින බවනම් මනාව පැහැදිලිය.

"පැය පහක්, වචන ලක්ෂයක් කතා කළාට වැඩක් නැත, වෙනිසියුලාව මුහුණ දුන්නෙත් මෙවැනි අර්බුධයකට බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා. මොකද

වෙනිසියුලාව කියන්නේ ලෝකයේ ලොකුම තෙල් නිධිය තිබෙන රටයි. අද ඒ රටේ පරිපාලනවත් කරගන්නට බැරිව කඩා වැටී තිබෙනවා.

වෙනිසියුලාවේ හිටපු ජනාධිපති හියුගෝ චාවේස් කියන ජනාධිපතිවරයා මේ වගේම පැය පහක්, හයක්, එක දිගට කතා කළා. ඇයි? කිසිදෙයක් කෙටියෙන් පැහැදිලි කරන්නට එතුමාට බැරි වුණ නිසා. කිසි දේකට පිළිතුරු නිබුණේ නැහැ. ජනප්‍රියතාවයයි, මාධ්‍ය තුළ කරන උච්චාරණයයි නිසා රටක් කරන්න පුළුවන් කියලා මේ මෑත ඉතිහාසයේ පෙන්නපු චාවේස්ගේ ගමන් මගේ තමයි අපේ රට යමින් තිබෙන්නේ. මෙය ඉතාම බරපතල තත්ත්වයක්.

මෙහි භායානකකම කුමක්ද? මේ ආදායම කියලා කියන බිලියන 1158න් සියයට 93ක්ම එන්නේ ඔබෙනුයි මගෙනුයි ගන්නා නානාප්‍රකාර බදු මුදල්වලින්.

රජය විසින් ස්වේච්ඡාවෙන් ආණ්ඩුවක් හැටියට තමන්ගේ මුළු යාන්ත්‍රණයම පාවිච්චි කරලා, නිෂ්පාදනය කරලා උපයන්න බලාපොරොත්තු වෙන්නේ බිලියන 459යි. මේ බිලියන 459 කොහොමද ලැබෙන්නේ? රාළහාමිලා ගහන දඩයෙන්, පාස්පෝට් එක ගන්න ගියාම ගෙවන මුදලින්, ඩ්‍රයිවින්ග් ලයිසන් එක ගන්න ගියාම ගෙවන ගානින්, ලයිසන් එක අලුත් කර ගන්න යන ගානෙන්. අද ලංකාව මහජනයාගෙන් උපරිම බදු අය කරගන්නා රාජ්‍යයක්, රටක්, ආර්ථිකයක් බවට පත්වී හමාරයි. මේ විදිහට තවදුරටත් යන්න බැහැ.

වතුර නටනතුරු පමණයි කකුළුවාගේ සොමිය කියලා කතාවක් තියෙනවනේ, දැන් වැඩේ පටන් අරන් තියෙන්නේ. මම ප්‍රාර්ථනා කරන්නේ නෑ ශ්‍රී ලංකියෙක් හැටියට මේ රට කඩා වැටෙන්න ඕනේ කියලා. මිනිස්සු නැවත පාරට බහින්න ඕන කියලා. නමුත් රට ගමන් කරන්නේ ඉතාමත් නරක තැනකටයි.

පෙරේදා කහපාට ගෑස් එක වැඩි කළා. ගිහිල්ලා අහන්න, මාධ්‍ය, අහිංසක අම්මලාගෙන් මොකද කියන්නේ කියලා. මේකටද ඡන්ද දුන්නේ කියලා අහන්නකෝ? ඒ මිනිස්සුන්ගේ වේදනාව අහන්න පුලුවන් වෙයි.

අපිටත් පුලුවන් පිටරටට ගිහිල්ලා ජීවත් වෙන්න. නමුත් මේ රටේ දරුවන්ගේ අනාගතය නිසා අපි මේ රටින් දෙයක් ගත්ත නිසා, ඒ රටට ආයේ දෙයක් කරන්න ඕන නිසා තමයි අපි මේ කෑ ගහන්නේ.
අපේ ඇස් පියවෙන්න කලින් මේ රටේ යහපත් සමාජයක්, සැහැල්ලුවෙන් ජීවත් විය හැකි ආර්ථිකයක් ගොඩනගන්නට තමයි අපි මේ කෑ ගහන්නේ, බලය අල්ලන්නවත්, නැත්නම් ආණ්ඩුවට දොස් කියන්නවත් නොවෙයි.

ඒ වගේම තව කාරණයක් මා මේ අවස්ථාවේදී සිහිපත් කරන්නම්, වැඩ බලන අටමාස්ථාන නායක ස්වාමීන් වහන්සේගේ නායකත්වයෙන් දැන් කියනවා, "ඔව්, අපි වැට ගහන්නේ නැත, මෙතන වැරදීමක් සිදු වී තිබෙනවා, බෞද්ධ ජනයා කැළඹීමට පත්වී තිබෙනවා, අපි තොරතුරු ලබා දීමට පරක්කු වුණා" කියලා.

මා කියනවා මේ මදි, මේ ගැසට් පත්‍රය සම්පූර්ණයෙන් අධ්‍යයනය කළ යුතුයි. ගරු ස්වාමීන් වහන්සේලාගේ පාද නමස්කාර කරලා අපි ඉල්ලා සිටින්නේ, මේ කාර්ය සුළුවට සලකන්නට එපා, ඒ නිසා මගේ යෝජනාව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යෝජනාව අපි අනුරපුර සුරකිමු කියන ජාතික සංවිධානයක් පිහිටුවනවා. එතැනින් සතිපතා මොකක්ද මෙතන වෙන්නේ කියන එක පිළිබඳව මහජනයාට බෞද්ධ, බෞද්ධ නොවන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවත් වෙන ජනයාට සහ ඊට සම්බන්ධ වන ජනයාට සත්‍ය කියන්න ඕනේ මොකද වෙන්නේ කියලා. මුදල් කොච්චර වියදම් වෙනවද? කාටද වියදම් වෙන්නේ? කොතැනද වියදම් වෙන්නේ කියන විනිවිදභාවයෙන් කටයුතු කළ යුතුයි.

ඒ වගේම අවසාන වශයෙන් මා කියන්නේ හෙට නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයාගේ නඩුව. ආණ්ඩුව උත්සාහ ගන්නේ එතුමාව 76 දවසක් හිරේ තියන්න. නාමල් රාජපක්ෂ මගේ පක්ෂයේ කෙනෙක් නෙමෙයි. ඔහු අපේ පක්ෂය කඩාගෙන ගිහිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලොකුම හානියක් කරපු පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක.

නමුත්, නීතිය ඉදිරි සියලු දෙනා සමාන වෙන්න ඕනේ නම්, සාක්ෂි තිබෙනවා කියලා කෙනෙක් කිව්වා කියලා නඩු අහන්න දවස් 75ක්. බැලූ බැල්මට මෙය අනීතික තත්ත්වයක් බව පැහැදිලියි.

මහාචාර්ය ජෝන් රොවිල්ස් කියන දාර්ශනිකයා,කියා තිබෙනවා *"Justice is nothing fairness"*. යුක්තිය යනු අන් කිසිවක් නොව සහධර්මත්වය, ඉටුකිරීමයි. ඊටපස්සේ කියන එක තමයි වැදගත් වෙන්නේ,*"It is not a political debate, it is not a philosophical debate, but a political project"*. ඒක දර්ශනවාදී කතාවක් නෙමෙයි, දේශපාලන ව්‍යාපෘතියක්. එහෙනම්, යුක්තිය ඉටුකිරීමේ දේශපාලන ව්‍යාපෘතිය නාමල් රාජපක්ෂට, අපේ පක්ෂයේ ජාතික සංවිධායක චාමර සම්පත්ට ඉදිරිපත් කරන්න, අපි රජයෙන් ඉල්ලනවා, සාක්ෂි තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කර, ඒවා විවර කර, දඬුවම් දෙන්න. මෙය සාධාරණය නොව අසාධාරණය කියලා කියන්න කැමතියි.

**මේ මාධ්‍ය සාකච්ඡාවට නව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ශිරාස් යූනුස් මහතා ද සහභාගී විය.**

**2026 නොවැම්බර් 17**